**පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2021**

පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධන සඳහා වූ කුවේට් අරමුදල අතර 2014 ජනවාරි 30 දින එළඹී අංක 886 දරණ ණය ගිවිසුමේ ඡේද 01 හි සඳහන් විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස්දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග, වරාය සහ නාවික අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. බස්නාහිර, සබරගමුව, නැගෙනහිර, දකුණ, වයඹ, මධ්‍යම සහ උතුරු පළාත් වල මගී සහ භාණ්ඩ ප්‍රවාහන ඉල්ලුම වර්ධනය වීමට මුහුණ දීම සඳහා සහ වාහන මෙහෙයුම් සහ මාර්ග නඩත්තු වියදම්, ප්‍රවාහන කාලය සහ අනතුරු අවම කිරීම මගින් අදාළ ප්‍රදේශවල ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා දායක වීම සඳහා මංතීරු දෙකක් සහිත පාලම් 25 ක් ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පැකේජය 01, 02 සහ 03 යන කොටස් තුනක් යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 4,632 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 35.41 ක් වන අතර එම මුදල සැපයීමට අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2015 සැප්තැම්බර් 07 වන දින ආරම්භ කල අතර 2017 සැප්තැම්බර් 05 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය මුලින් 2019 දෙසැම්බර් 31 දක්වාත් පසුව 2023 දෙසැම්බර් 31 දක්වාත් දීර්ඝ කර තිබුණි.

**1.3 මතය.**

2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහයන් ගෙන් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ අයුරින් පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම.**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණන කාලය තුළදී හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලනයේ වැදගත් අකාර්යක්ෂමතා ඇතුළුව අනෙකුත් කරුණු අතරින් වැදගත් විගණන සොයාගැනීම්, සම්බන්ධ පාර්ශවයන් සමඟ සන්නිවේදනය කරනු ලැබේ.

**2. භෞතික කාර්යසාධනය.**

**2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය.**

මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලබන්නේ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල (KFAED) වන අතර ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් පැකේජ 03 කට බෙදා ඇත. 01 පැකේජයට ඇතුළත් වන රු. මිලියන 1,168.35 ක් වන පාලම් 08 ක් සැලකිය යුතු ලෙස සම්පූර්ණ කර 2020 ජුනි 19 වන දින මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දෙන ලදී. 02 පැකේජයට ඇතුළත් පාලම් 09 න් රුපියල් මිලියන 279.43 ක වියදමින් යුත් පාලම් 05 ක් නිම කර 2021 දෙසැම්බර් 31 දින වන විට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දී තිබුණි. කෙසේ වෙතත්, 03 පැකේජයට ඇතුළත් කර ඇති ඉතිරි පාලම් 08 හි භෞතික ප්‍රගතිය ඒම දිනය වන විට සියයට 71.2 ක් ලෙසත්, ඒක් පාලමක් පමණක් සම්පූර්ණ කර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දී තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ විදේශ ණය ප්‍රතිපාදන වලින් සියයට 26 කට සමාන රුපියල් මිලියන 533.26 ක් 2021 දෙසැම්බර් 31 දිනට භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3.2 ව්‍යාපෘති අරමුණු වලින් බැහැරව කරන ලද ගෙවීම්.**

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතියට (JICA) අදාළ රු. මිලියන 10.014 ක වන්දි ගෙවීමක් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව ව්‍යාපෘතිය මගින් සිදු කර තිබුණි. | ප්‍රධාන පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාල වන්දි ගෙවීම සඳහා මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයාගේ වාචික අනුදැනුම ඇතිව පාලම් 25ක් නැවත ඉදි කිරීමේ ව්‍යාපෘතියේ මුදල් යොදවා ඇත. | ප්‍රධාන පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතියේ වන්දි පිරිවැය අයකරගත යුතුයි. |